# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,680 — 1959 පෙබරවාරි 27 වැනි සිකුරාද—27.2.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 507 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | 525 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 510 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 513 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 525 | විවිධ දැන්වීම් ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්. කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත් සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නවප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවෝ වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදිප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධසේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද. ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලක රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද" යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කාන්තා ගොවිපල් උපදේශිකා තනතුරු (තාවකාලික)

කාන්තා ගොවිපල් උපදේශිකා තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—මේ තනතුරුවලට අදාල වාර්ෂික වැටුප් පරිමාණය රු. 918—42—1,464ක් වේ.

3. සේවා කොන්දේසි—

(i) මෙම තනතුරු නියත වශයෙන්ම තාවකාලිකය.

(ii) අවුරුදු තුනක පරීක්ෂා කාලයකට යටත් වේ.

(iii) තෝරා ගනු ලබන අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අපේක්ෂිකාවක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය.

(ආ) කුණ්ඩසාලේ කාන්තා කෘෂිකර්ම විද්‍යාලයේදී කෘෂිකර්මය පිළිබඳ දෑවුරුද්දක පාඨ මාලාවක් සාර්ථක ලෙස අවසන් කර ලබාගත් සහතික පත්‍රය.

(ඇ) සිංහල හෝ ද්‍රවිඩ භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාවක් තිබිය යුතුය.

5. **වයස සීමාව.**—1959 මාර්තු මස 14 වැනි දින වන විට අපේක්ෂිකාවන්ගේ වයස අවුරුදු 21කට අඩු නොවිය යුතු අතර අවුරුදු 45කට වැඩි නොවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවාවේ නියුක්තව සිටින අපේක්ෂිකාවන් කෙරෙහි මෙම වයස සීමාවේ බලය පැමක් නොමැත.)

6. සෑම අපේක්ෂිකාවක්ම තමාගේ අයදුම් පතට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකයේ පිටපත;

(ආ) ලබාගත් උසස්තම අධ්‍යාපන සහතික පත්‍රයේ පිටපත;

(ඇ) ලබා ඇති උසස්තම කාර්මික සහතික පත්‍රයේ පිටපත;

(ඈ) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක පිටපත්.

7. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම් පත් 1959 මාර්තු මස 14 වැනි දිනට හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙත ලැබෙන්ට සැලැස්විය යුතුයි.

අයදුම් පත් හෝ ඊට අදාල සෙසු සෑම ලියකියවිල්ලක්ම එවිය යුත්තේ කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙතය. දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධරයෙකුගේ පෞද්ගලික නමට අයදුම් හා ලියකියවිලි නොඑවිය යුතුය.

මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළව ඇති රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වූ කොන්දේසි කියවා බලන්න.

එම්. එෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 පෙබරවාරි 10 වැනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

**කාන්තා ගොවිපල් උපදේශිකා තනතුරු පිළිබඳ අයදුම් පතේ ආකෘති පත්‍රයයි**

1. (අ) සම්පූර්ණ නම :————.
   (ආ) ලිපිනය :————.

2. උපන් දිනය හා ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

3. ජාතිය :————.

4. ලබා ඇති උසස්තම අධ්‍යාපන සුදුසුකම :————.
   (සමත්ව ඇති විෂයයන් කවරේදැයි සඳහන් කළ යුතුය)

5. ලබා ඇති උසස්තම කාර්මික සුදුසුකම් :————.

6. සිංහලෙන් හෝ ද්‍රවිඩ භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාවක් තිබේද ? :————.

මවිසින් මෙම අයදුම් පතෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මේ අයදුම් පතෙහි කිසියම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් තිබුණ බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු වන බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව දැන ගන්නට ලැබුනහොත් කිසිම වන්දියක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—

පේරාදෙණියේ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා වෙතටයි.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### II වැනි ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුරක්

II වැනි ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුරක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—මේ තනතුරට අදාල වාර්ෂික වැටුප් පරිමානය රු. 1,860—120 × 16—රු. 3,780 ක් වේ.

3. සේවා කොන්දේසි.—(1) මේ තනතුර සථිරය. විශ්‍රාම වැටුප් රහිතය. (2) පත්වීම අවුරුදු තුනක පරීක්ෂා කාලයකට යටත් වේ. (3) තෝරා ගනු ලබන අපේක්ෂකයා දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සූදානම් ව සිටිය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(1) (අ) ගණිතය ඇතුළු උසස් ගණිතය, යාන්ත්‍රික බලධම් විද්‍යාව (Mechanis) හා භෞතික විද්‍යාව යන විෂයයන් ගෙන් එකකින් හෝ වැඩි ගණනකින් යුක්තව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතු අතර

(ආ) පිළිගත් සිවිල්, යාන්ත්‍රික හෝ කෘෂිකාර්මික ආයතනයක ආධුනික කාලසීමාව හැර තවත් අවුරුදු පහක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

නැතහොත්

(2) (අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් ගේ පාඨමාලාව සාර්ථක අන්දමින් අවසන් කර තිබිය යුතු අතර පිළිගත් සිවිල්, යාන්ත්‍රික, විදුලි හෝ කෘෂිකාර්මික ඉංජිනේරු ආයතනයක ආධුනික කාලය හැර තවත් අවුරුදු 3ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(3) වයස අවුරුදු 25ට නොඅඩුවිය යුතු අතර මනා චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයකින් යුක්ත විය යුතුය.

සංලක්ෂ්‍යය.—(1) (අ) ඡෙදයෙහි දක්වෙන අධ්‍යාපන සුදුසුකම් වලින් තොර වුවද සෙසු සුදුසුකම් ඇති දෙපාර්තමේන්තුවේ සේවාවේ යෙදී සිටින අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍රද භාරගනු ලැබේ.

5. සෑම අපේක්ෂකයෙකුම තමාගේ අයදුම් පතට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය :—

(1) උප්පැන්න සහතිකයේ පිටපත

(2) ලබා ඇති උසස්තම අධ්‍යාපන සහතික පත්‍රයේ පිටපත;

(3) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක පිටපත්;

(4) කාර්මික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර වල පිටපත්.

6. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වනසේ පිළියෙල කරන ලද අයදුම්පත් 1959 මාර්තු මස 14 වැනි දිනට හෝ ඊට පෙර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි. එවැනි ඉල්ලුම් පත්‍ර කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමාගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ මුල පළව ඇති රාජ්‍ය සේවා තනතුරු වලට අදාලවූ පොදු කොන්දේසි කියවා බලන්න.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න.
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 පෙබරවාරි 20 වැනි දින,
පේරාදෙණියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදිය.

### II වැනි ශ්‍රේණියේ කෘෂිකර්ම ඉංජිනේරු සහායක තනතුර පිළිබඳ අයදුම් පතේ ආකෘති පත්‍රයයි

1. නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. උපන් දිනය :————.
5. අයදුම්කරුගේ පියා උපන් දිනය හා ස්ථානය:————.
6. ලබා ඇති උසස්තම අධ්‍යාපන සුදුසුකම :————.
7. කාර්මික සුදුසුකම් :————.
8. පළපුරුද්ද :————.
9. අමුණා ඇති චරිත සහතික පත් දුන් තිදෙනෙකුගේ නම් සහ ලිපින :————.

අත්සන :————.

දිනය :————.

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ආධුනික කිමිදුම්කරුවන්ගේ තනතුරු

මෙම දෙපාර්තමේන්තුවේ ආධුනික කිමිදුම්කරු තනතුරු 2 ක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

මෙහි පහත සඳහන් ආකෘතිය අනුව සකස් කරනු ලබන අයදුම් පත් 1959 මාර්තු මස 14 වෙනි දිනට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන්ට ඉදිරිපත් කළ යුතුයි.

2. අධ්‍යාපනික සුදුසුකම්.— ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් විය යුතුයි. ගණිතය හා භෞතික විද්‍යාව සමග සමත්වුවන්ට විශේෂ සැලකිලි දක්වනු ඇත. ගණිතය හා භෞතික විද්‍යාව සමග කණිෂ්ඨ පාඨශාලා විභාගයෙන් සමත්වුවන් මිකැනික් කෙනෙක් වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක පළපුරුද්දක් හෝ කිමිදුම් කරුවෙකු වශයෙන් පළපුරුද්දක් තිබිය යුතුයි.

3. වයස.—1959 මාර්තු 14 වැනි දිනට අයදුම් කරුවන්ගේ වයස අවුරුදු 17 ට නොඅඩු හා අවුරුදු 24ට නොවැඩි විය යුතුයි.

4. ශාරීරික අවශ්‍යතාවයන්.—සෑම අයදුම්කරුවෙක්ම හොඳ ශරීරයක් ඇත්තකු හා හොඳ ඇස්පෙනීමක් ඇත්තෙකු විය යුතුයි. මේ සම්බන්ධව විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට භාජන කරවනු ලබනුයේ ආධුනිකත්වය ඇරඹීමට ප්‍රථමය.

5. පුහුණුව පිළිබඳ විස්තර.—කිමිදුම් කරුවෙකු වශයෙන් පුහුණුවක් ලැබීමට යෝග්‍යතාවය පරීක්ෂා කිරීම්වස් පළමු හය මාසය තුළ කිමිදුම් වැඩවල අභ්‍යාසයක් ලබාදෙනවා ඇත. මෙම සෝදිසි කාලය තුළ ආධුනිකයාගේ යෝග්‍යතාවය ප්‍රත්‍යක්ෂ වුවහොත් එතැන් සිට තව අවුරුදු 2 1/2 ක් පුහුණුවක් ඔහුට ලැබෙනවා ඇත. යෝග්‍යතාවය අසතුටු නම් ආධුනිකත්වය නතර කරනු ඇත.

6. ලංකා කාර්මික විද්‍යාලයේ කෙටුම්පත් කරුවන්ට හෝ සුළු පරිපාලකයන්ට හෝ මිනින්දෝරු ආධුනිකයන්ට හෝ නියමිත පාඨමාලාව සාර්ථක ලෙස නිමා කර ඇති අයදුම්කරුවන්ට ආධුනික කාලය අවුරුදු දෙකකට සීමා කරනු ඇත.

7. මෙම ආධුනික කාලය සාර්ථක ලෙස නිමකිරීමෙන් පසු තම පුහුණුව හා රාජකාරියයන් පිළිබඳ මනා අවබෝධයක් හා දක්ෂකමක් දක්වුවහොත් මෙම දෙපාර්තමේන්තුවේ "නැව්" කිමිදුම්කරු තනතුරකට පත්කරගනු ලැබේ. "නැව්" කිමිදුම්කරු වශයෙන් තුන් අවුරුදු සේවාකාලයකට පසු නාවික කර්මාන්තය පිළිබඳ දෑවුරුදු පුහුණුවක් එක්සත් රාජධානියෙහි හෝ වෙනයම් තැනක හෝ ලබාදීමට කටයුතු කරනු ඇත.

8. වැටුප්.—ආධුනික කාලය තුළ ගෙවනු ලබන වැටුප් ක්‍රමය මෙසේය :—

| | | |
|---|---|---|
| පළමුවන අවුරුද්ද තුළ දිනකට | රු. | 2.80 |
| දෙවෙනි ,, ,, ,, | රු. | 3.20 |
| තෙවෙනි ,, ,, ,, | රු. | 3.60 |

ආධුනිකත්වය සාර්ථකව නිමකර "නැව්" කිමිදුම්කරු වශයෙන් පත්වීමක් ලැබුවහොත් රුපියල් 2,820—120 හා 180—5.340 දරණ වාර්ෂික වැටුප් ක්‍රමය යටතේ ගෙවනු ඇත. අතිකාල දීමනා නොගෙවනු ලැබේ. නැව් කර්මාන්තය පිළිබඳ වැඩිදුර පුහුණුවක් නෞකා-කර්මාන්තය පිළිබඳ ආයතනයක සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු රු. 6,600—360—8,400 දරණ වාර්ෂික වැටුප් ක්‍රමය යටතේ ගෙවනු ලැබේ.

9. ගිවිසුම.—ආධුනිකත්වය සාර්ථක ලෙස නිමකරන බවට ඇපයක් වශයෙන් තෝරාගනු ලබන අයදුම්කරු තමාගේ පියා හෝ භාරකාරයා හෝ ඇතුළුව රජයත් සමග ගිවිසුමකට බැඳිය යුතුයි.

නැව් තනන ආයතනයක පුහුණුව සඳහා තෝරාගනු ලැබුවහොත් එම පුහුණුව සාර්ථක ලෙස නිම කර ආපසු පැමිණ රජය යටතේ අවුරුදු 5ක් සේවය කරන බවට පොරොන්දු ඔප්පුවක් අත්සන් තැබිය යුත්තේ පුහුණුව සඳහා බැහැර යාමට පෙරය.

10. අයදුම්කරුවන් ඔවුන්ගේ වයස හා සුදුසුකම් පිළිබඳව සම්පූර්ණ විස්තර ඉදිරිපත් කළයුතුයි. මෙහි සඳහන් නියමයන් වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. අයදුම්පත් සමග මෑතකදී ලබා ගත්තාවූ සහතික පත්වල පිටපත් තුනක් ඉදිරිපත් කළ යුතුයි.

11. රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් මේ ගැසට් පත්‍රයේ I කොටසේ II ඡෙදයේ මුල දක්වෙන සාමාන්‍ය කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට භාජන කරනු ලැබේ.

ඊ. සී. ද අල්විස්,
වරාය කොමසාරිස්තුමා වෙනුවට.

වරාය කොමිෂන් සභා කාර්‍යාලය,
කොළඹ 1,
1959 පෙබරවාරි 18 වන දින.

ආකෘති පත්‍රය

**වරාය කොමිෂන් සභාවේ ආධුනික කිමිදුම්කරු තනතුර**

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය සහ වයස :————.

(4) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(5) කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(6) නිවේදනයෙහි අඩංගු සුදුසුකම් ඇත්තෙහිද ? :————.

(7) ඇප තැබීමට කැමැත්තෙහිද ? :————.

මෙම අයදුම් පතෙහි ඇතුළත් විස්තර සත්‍ය හා නිවැරදි බැව් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ටයිප් ගසන්නන් සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—මාර්තු, 1959

භාණ්ඩාගාරයේ අංකය : 1/60/5 (ජී).

අංක 11,664 දරණ 1959 පෙබරවාරි මස 13 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලද 1959 පෙබරවාරි මස 3 වැනි දින දරණ නිවේදනය හා සම්බන්ධයි. 1958 මාර්තු මස 15 වැනි දින පවත්වන්නට යෙදුන ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම සඳහන් අපේක්ෂකයා ද ටයිප් ගසන්නන්ගේ සේවයට පත්කර ගැනීමට තෝරා ගනු ලැබූ බැව් මෙයින් දැනුම් දෙමි.

| නම | ලිපිනය |
|---|---|
| කරුණාරත්න, ඩබ්ලිව්. පී. එම්. | කාක්කපල්ලිය. |

2. ඉහත් සඳහන් අපේක්ෂකයාට වහාම පත්වීමක් දීමට ආණ්ඩුව භාරගන්නේ නැත. නමුත්, ඇබෑර්තුවක් ඇති වූ විට, ඔහුට පත්වීමක් දෙනු ලැබේ. පත්වීම තුන් අවුරුද්දක් යන තුරු අස්ථිර වනු ඇත. අපේක්ෂකයා විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සාමාර්ථය ලැබිය යුතුයි. තවද, ඔහු ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලට ද යටත් වෙනවා ඇත.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1959 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ මහා භාණ්ඩාගාරයේ දීය.

---

## කො/ඇන්ඩර්සන් පාරේ පිහිටි රජයේ මහා විද්‍යාලය, කළුබෝවිල—දෙහිවල

**ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම**

6.2.59 දින දතම, නො. 11,659 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීමට අමතර වශයෙන් පහත සඳහන් පන්තිවලට ද 1.3.59 දින පටන් ශිෂ්‍යයන් ඇතුළත් කරගනු ලබන බව මෙයින් දන්වනු ලැබේ. ඒ ඒ පන්තිවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍යයින්ගේ වයස් සීමාවන් පහත පළවෙනවා ඇත :—

| | | | | |
|---|---|---|---|---|
| 3 පන්තිය | ... | 7.6 | සිට | 8.6 |
| 4 පන්තිය | ... | 8.6 | සිට | 9.6 |
| 5 පන්තිය | ... | 9.6 | සිට | 10.6 |
| 6 පන්තිය | ... | 10.6 | සිට | 11.6 |
| 7 පන්තිය | ... | 11.6 | සිට | 12.6 |
| 8 පන්තිය | ... | 12.6 | සිට | 13.6 |
| පූර්ව ජ්‍යෙෂ්ඨය | ... | 13.6 | සිට | 14.6 |
| ජ්‍යෙෂ්ඨ පන්තිය | ... | 14.6 | සිට | 15.6 |

2. ශිෂ්‍යයන් 35 දෙනෙකුට වඩා එක පන්තියකට ඇතුළත් කර නොගන්නා අතර එක පන්තියක් වෙනුවෙන් ඊට වැඩි ප්‍රමාණයක් අයදුම්කරුවන් සිටී නම්, නියම කරගත් දිනයක පාසැලේ ප්‍රධානාචාර්ය්‍ය තැන පවත්වන තෝරා ගැනීමේ පරීක්ෂණයකට පෙනී සිටීමට අයදුම්කරුවන්ට සිදුවෙනුවා ඇත. එම විභාගය සිංහල භාෂාව, අංක ගණිතය, සාමාන්‍ය දැනීම සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයයන්ගෙන් සමන්විත වනුවා ඇත.

3. දැනට පාඨශාලා පහසුකම් නොමැති ශිෂ්‍යයන් ගැනද පදිංචි ස්ථානයෙන් බැහැර ඇත පළාත්වල පිහිටි පාඨශාලාවලට ඇතුළත් වීමට සිදුවී ඇති අභිනව පාඨශාලාව පිහිටි ස්ථානයේ සිට සැතපුම් දෙකක් ඇතුළත පිහිටි ප්‍රදේශයේ පදිංචි ශිෂ්‍යයන් භාර ගැනීම ගැනද විශෙෂයෙන් සලකා බලනු ලැබේ.

4. ශිෂ්‍යයන් ඇතුළත් කර ගන්නා දිනයේදී දෙමාපියන් විසින් ළමයින්ගේ වයස පිළිබඳ පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමට කැමැති දෙමාපියන් හෝ භාරකාරාදීන් 5.3.59 දිනට පළමු පහත සඳහන් ලිපිනයෙන් ඉල්ලුම් කළ යුතුය :—

ප්‍රධානාචාර්ය්‍යතැන,
ඇන්ඩර්සන් පාරේ රජයේ මහා විද්‍යාලය,
කළුබෝවිල—දෙහිවල.

ඩබ්ලිව්. ඇම්. ඒ. වර්ණසූරිය,
බටහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැන.

අධ්‍යාපන කාර්‍ය්‍යාලය,
තර්ස්ටන් පාර,
කොළඹ 3,
23.2.59.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ආධුනික සෞඛ්‍ය පරීක්ෂකයන් පුහුණුකරවීමේ පන්තියට අයදුම්කරුවන් තෝරාගැනීම**

සෞඛ්‍ය පරීක්ෂකයන් පුහුණුකරවීමේ පන්තියට ආධුනිකයන් බඳවාගැනීම පිණිස 1959 මැයි මස 2 වැනි දින පැවැත්වෙන තරග පරීක්ෂණය සඳහා (පිරිමි) ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත්, විභාගයට ඇතුළත්වීමට අවශ්‍ය සුදුසුකම්, පුහුණුවීමේ හා සේවයේ කොන්දේසි පිළිබඳ සම්පූර්ණ විස්තර පහත පළවේ.

2. **සුදුසුකම්**.—සෑම අයදුම්කරුවකුම—

(අ) 1959 පෙබරවාරි මස 1 වැනි දිනට ඔහුගේ වයස අවුරුදු 19 ට නොඅඩුව, අවුරුදු 24 ට නොවැඩිව ඇති බවත් ;

(ආ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් සමත්වී ඇති බවත්, පිළිගත හැකි සහතික මගින් ඔප්පු කළ යුතු ය.

3. **ඉල්ලුම් පත් එවිය යුතු පිළිවෙල**.—(අ) ඉල්ලුම් පත්‍ර සපයනු නොලැබේ. මෙහි පහත් දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, තැපැල් පෙට්ටිය 500, කොළඹ 1" යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "සෞඛ්‍ය පරීක්ෂකයන් පුහුණුකරවීමේ පන්තියට ඇතුළුවීම සඳහා කරන ඉල්ලීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ආ) අයදුම් පත් මෙහි පහත අත්සන් කර ඇති නිලධාරිවරියාගේ හෝ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේදී බාර දීම හෝ නොකළ යුතුය.

(ඇ) රුපියල් 5 ක් වටිනා මුද්දර අලවා අයදුම්කරුගේ අත්සන යොදා ඒවා අවලංගු කළ යුතු ය.

(ඈ) අයදුම්කරු යම් තැනැත්තකු යටතේ සේවය කරයි නම්, තමා මෙම පුහුණුවීම පිණිස තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා නියමිත දිනට යතහැකි පරිදි, සේවයෙන් නිදහස් කිරීමට තම ස්වාමියාගේ කැමැත්ත ප්‍රකාශ කෙරෙන ලිපියක් ඉල්ලුම් පත්‍රය සමඟ අමුනා එවිය යුතුය.

(ඉ) අයදුම් පත්‍රය සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් ද අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත (මේ සඳහා බව්තිස්ම සහතික, දිවුරුම් පෙත්සම්, සඳහන් හෝ අධ්‍යාපන සංග්‍රහය යටතේ නිකුත් කෙරෙන සහතික භාරගනු නොලැබේ).

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකයේ පිටපත.

(ඊ) **සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය.**—පුහුණු වීමේ කාලය තුළදී ආධුනිකයන්ට මැනවින් සැදුන නේවාසිකාගාරයක නවාතැන් පහසුකම් සපයනු ලැබේ. පුහුණුවීමේ කාලය තුළදී මාසයකට රු. 50ක දීමනාවක් ගෙවනු ලැබේ.

(උ) **පන්තියෙන් පහ කිරීමේ බලය.**—පුහුණුව ලබමින් සිටින කිසියම් ආධුනිකයකුගේ පැමිණීම, ඉගෙනීම හා හැසිරීම යනාදී කරුණු අයහපත් යැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට ඒත්තු ගියහොත් පුහුණුව ලබමින් සිටින කවර අවස්ථාවකදී වුව ද පන්තියෙන් පහ කිරීමට ඉඩ තිබේ. මෙසේ පහ කළ ආධුනිකයකුට ඔහුගේ ගාස්තු ආපසු ගෙවීමක් නොමැත. තවද ඔහු ඊටපසු කිසි දිනක පුහුණු වීම සඳහා නැවත තෝරාගනු නොලැබේ. සිය කැමැත්තෙන් අස්ව යන ආධුනිකයකුට ගාස්තු ආපසු නොලැබෙනවා පමණක් නොව, ඔහු පුහුණු වන කාලය තුළදී ලැබූ දීමනා දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට ද සිදු වන්නේ ය.

(ඌ) **යෝග්‍යතා පරීක්ෂණය.**—පුහුණුවීම අවසානයේ දී ලන්ඩනයේ පිහිටි සෞඛ්‍ය පිළිබඳ රාජකීය සංගමයේ ප්‍රාදේශීය විභාග මණ්ඩලය මගින් යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මේ පරීක්ෂණය සිද්ධාන්ත, වාචක (Oral) හා ප්‍රායෝගික යන තුන් අයුරින් ම කෙරේ.

(එ) **පත්වීම.**—සෞඛ්‍යය පිළිබඳ (ලන්ඩන්) රාජකීය සංගමයේ පරීක්ෂකවරයින් විසින් පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත් වූවන් පුරප්පාඩු ඇතිවන පරිදි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයින් වශයෙන් පත් කරනු ලැබේ.

7. **වැටුප, දීමනා හා සේවා කොන්දේසි.**—සෑම පත්වීමක් ම කරනුයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක සේවයේ II වැනි පෙළට ය.

**වැටුප් ක්‍රමය :—**

ම. සෞ. ප. II වැනි පෙළ : රු. 1,140—120×13—රු. 2,700 ; වාර්ෂික වැටුප රු. 1,980 දී කාර්යක්ෂමතා කඩඉම වේ.

ම. සෞ. ප. I පෙළ : වාර්ෂික වැටුප රු. 2,820—120×9 හා 180×1—රු. 4,080.

වාර්ෂික වැටුප රු. 3,420 දී කාර්යක්ෂමතා කඩඉම වේ.

ම. සෞ. ප. විශේෂ පෙළ : වාර්ෂික වැටුප රු. 4,260—180×6 හා 240×1—රු. 5,580. වාර්ෂික වැටුප රුපියල් 4,980 දී කාර්යක්ෂමතා කඩඉම වේ.

8. **දීමනා.**—ආණ්ඩුවේ රෙගුලාසි අනුව ජීවන වියදම්, විශේෂ ජීවන වියදම් හා ගෙවල් කුලී දීමනා ගෙවනු ලැබේ. දෙපාර්තමේන්තුවේ රෙගුලාසි අනුව පරිවර්තිත ගමන් ගාස්තු දීමනාව, නිවාස දීමනාව හා කාර්යාල දීමනාව, නිල ඇඳුම්, හෙල්මට් හා වැනි කබා දෙනු ලැබේ.

9. (i) රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තුවේ විධාන හෝ රෙගුලාසි සහ ආණ්ඩුව මගින් කලින් කල නිකුත් කරනු ලබන සෙසු විධානවලට හෝ රෙගුලාසි වලට ඔබ යටත් වෙන්වා ඇත. සෑම පත්වීමක් ම ස්ථිර වන්නේ අවුරුදු 3ක පරීක්ෂණාත්මක කාලසීමාවකින් පසුව ය.

(ii) මුළු විභාගයටම සිංහල භාෂා මාධ්‍යයෙන් පෙනී නොසිටි ආධුනිකයින් පත්වීම් සඳහා තෝරාගනු ලැබුවහොත් පරීක්ෂණාත්මක කාලය තුළදී ඔවුන් සිංහල භාෂාව ඉගෙනගත යුතු ය. පරීක්ෂණාත්මක කාල සීමාව අවසානයේ දී මේ අයදුම්කරුවන්ගේ පත්වීම් ස්ථිර කරනු ලබන්නේ, අන් කරුණු ද ඇතුළුව, සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වුවහොත් පමණකි.

(iii) පරීක්ෂණාත්මක කාලය තුළදී සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්වයකට එළඹිය නොහැකි වූවන්ගේ සේවය නවතාලීමට ඉඩ තිබේ. එහෙත් රාජ්‍ය භාෂාව ඉගෙනීමෙහි ලා නිර්ව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට පෙනී ගියහොත් එසේ සේවාව නවතාලීම කල් දමනු ඇත. ඉන්පසු සෑහෙන කාලසීමාවක් තුළදී ආධුනිකයින් එම පරීක්ෂණයෙන් සමත් වුවහොත් ඒ පිළිබඳ වගකීම උසුලන නිලධාරිවරයාගේ අභිමතය පරිදි ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ යෑම ද වෙනස්කරනු ලැබිය හැක.

රජයේ සේවයට පත්කරනු ලබන සෑම "නව ප්‍රවේශකයකුම" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත් විශේෂයෙන් වර්ෂ 1956 යේ 33 වැනි අංකය දරන රාජ්‍ය භාෂා පනතේ වගන්තීන් ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇත්තාවූත්, මතුවට පනවනු ලබන්නාවූත් ව්‍යවස්ථාවලට අනුකූලව ඔබ විසින් ක්‍රියා කළ යුතු ය.

10. **රාජකීය සෞඛ්‍ය සංගමයේ සහතික ප්‍රදානය කිරීම.**—සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට බැඳී අවුරුද්දක් සතුටුදායක අන්දමින් සේවය කළ මහජන සෞඛ්‍ය පරීක්ෂකයන්ට ලන්ඩන් රාජකීය සෞඛ්‍ය සංගමයේ සහතික පත්‍ර ප්‍රදානය කරන ලෙස නිර්දේශ කරනු ලැබේ.

11. යෝග්‍යතා පරීක්ෂණයෙන් වරක් අසමත්වූ අයදුම්කරුවකුට පුහුණුවීමට හෝ පරීක්ෂණයකට හෝ කැඳවනු ලබන්නේ රාජකීය සෞඛ්‍ය සංගමයේ ප්‍රාදේශීය විභාග මණ්ඩලය මගින් කෙරෙන ඉල්ලීමකට සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ අනුමතිය ලැබුණහොත් පමණකි.

12. මෙහි ඉහත සඳහන් ආවශ්‍යකතාවයන් සියල්ල සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඒ සඳහා යොදනු ලැබූ මුද්දරවල වටිනාකම ආපසු ගෙවනු නොලැබේ. අයදුම්කරුවකුට අසනීපයක් නිසා විභාගයට ඉදිරිපත් වීමට නොහැකි වුවහොත් ඒ බවට ලියාපදිංචිවූ, සුදුසුකම් ඇති වෛද්‍යවරයකුගේ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ විට මුද්දර ගාස්තුවලින් 3/5ක් ආපසු ගෙවනු ලැබේ.

14. මෙහි පහත දැක්වෙන ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1959 මාර්තු මස 23 දිනට පෙර, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට ලැබෙන සේ එවිය යුතු ය.

ඩබ්ලිව්. ඒ. කරුණාරත්න,
නියෝජ්‍ය (මහජන සෞඛ්‍ය සේවා) අධ්‍යක්ෂ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1959 පෙබරවාරි මස 27 දින කොළඹ දී ය.

## අයදුම් පත්‍රයේ ආකෘතිය

**ආධුනික මහජන සෞඛ්‍ය පරීක්ෂකයන්ගේ විභාගය**

1. නම (මුලකුරු සහිතව) :————.
   නාමය :————.
   පෙළපත් නාමය :————.
2. ලිපිනය :————.
3. වයස හා උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.
4. ජාතිය හා ආගම :————.
5. විවාහක ද අවිවාහක ද යන වග :————.
6. පුරවැසි භාවය—
   (අ) පරම්පරාවෙන් ද :————.
   (ආ) ලියාපදිංචි කිරීමෙන් ද :————.

පුරවැසි බව ලැබුවේ පරම්පරාවෙන් නම් පහත සඳහන් තොරතුරු සැපයිය යුතු ය :————.

(අ) අයදුම්කරු උපන් ස්ථානය :————.
(ආ) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
(ඉ) අයදුම්කරුගේ පියාගේ අත්තා උපන් ස්ථානය : ————.
(ඊ) අයදුම්කරුගේ පියපස මුත්තා උපන් ස්ථානය :————.

අයදුම්කරු උපන්නේ ලංකාවේ නම් (අ) සමග (ආ) හෝ (ඉ), (ඊ) යන දෙක හෝ පිරවිය යුතුය. අයදුම්කරු උපන්නේ ලංකාවේ නොවේ නම් (අ) සමග (ආ) (ඉ) යන දෙකින් එකක් හෝ (ඉ), (ඊ) යන දෙකින් එකක් හෝ පිරවිය යුතු ය.

7. අවසාන වශයෙන් සමත්වූ විභාග හා ඉගෙනීම ලත් පාඨශාලාව : ————. (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)
8. දෙමව්පියන්ගේ ලිපිනය හා ඔවුන්ගේ පුරවැසිභාවය :————. (පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග).
9. ක්‍රිකට්, පාපන්දු හා බාලදක්ෂ වැනි පාඨශාලා කටයුතු වලට සහභාගි වී තිබේ ද :————.
10. අයදුම්කරු දැනට කරන රක්ෂාව :————.
11. රක්ෂාවක නියුක්ත නම් ඔබේ ස්වාමියා ඔබට පුහුණුවීමට යනැකි වන පරිදි නිදහස් කරයි ද ? :————.
12. ඔබ මීට පෙර පුහුණුවීමේ පන්තියට ඇතුළුවී තිබේ ද :————.

මම අකාර්යක්ෂම භාවය නිසා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා හෝ අස්කරනු ලබා හෝ නොමැති බවත් ක්‍රිමිනල් වරදකට උසාවියක් මගින් දඬුවම් ලබා නොමැති බවත් ප්‍රකාශ කරමි. තවද මේ සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශයක් කළහොත් ඊට දඬුවම් වශයෙන් රාජ්‍ය සේවයෙන් වහා පහකරනු ලබන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

(අයදුම්කරු විසින් රුපියල් 5ක් වටිනා මුද්දර මෙහි අලවා ඒ මත අත්සන හා දිනය යොදා, ඒවා අවලංගු කළ යුතු ය).

## සමුපකාර දෙපාර්තමේන්තුව

**විවිධසේවා සමුපකාර සමිතිවල කළමනාකරුවන් හෝ ලේකම්වරුන් වශයෙන් සේවය කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පුහුණුකිරීම**

ඉහත දැක්වෙන අභ්‍යාස පංක්තියට ඇතුල් වීම අපේක්ෂාකරන අයදුම්කරුවන් විසින් ඒ සඳහා නියමිත ආකෘති පත්‍ර සමුපකාර විද්‍යාලයාධිපති තැනගෙන් හෝ අයදුම්කරු පදිංචි වී සිටින දිස්ත්‍රික්කය භාර සමුපකාර සංවර්ධන උපකොමසාරිස් තැනගෙන් හෝ, ලබාගෙන 1959 මාර්තු මස 25 වන දිනට හෝ ඊයට පෙර ලැබෙන ලෙස " සමුපකාර විද්‍යාලයාධිපති, සමුපකාර විද්‍යාලය, පොල්ගොල්ල " යන ලිපිනයට එවන මෙන් මෙයින් ආරාධනය කරනු ලැබේ.

**අභ්‍යාස පංක්තිය පැවැත්වෙන කාල සීමාව**

1959 ජූනි මස 9 වැනි ද සිට 1959 සැප්තැම්බර් මස 9 වැනි ද දක්වා.

**උගන්වන විෂය මාලාව**

සමුපකාරය, පොත් තැබීම ගණන් තැබීම, ලේකම් පුහුණුව, විකුණුම් ශාස්ත්‍රය හා පරිපාලනය.

**අභ්‍යාස පංක්තියට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය සුදුසුකම්**

1959 මාර්තු මස 25 වැනි දිනට වයස අවුරුදු 21ට වැඩි වූ ද, අවුරුදු 40ට අඩු වූ ද, පහත දැක්වෙන අතිරේක සුදුසුකම් ඇත්තාවූ ද, ඕනෑම කෙනෙකුට මේ පංක්තියට ඇතුළත්වීමට ඉල්ලා සිටිය හැකිය.

**අතිරේක සුදුසුකම් : —**

(1) සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සාමර්ථ්‍ය ලැබ සිටිය යුතුයි. එසේ සාමර්ථ්‍ය ලැබුවක් අංක ගණිතය හෝ වාණිජ ගණිතය හෝ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින්වත් සම්මාන සාමර්ථ ලබා තිබීම හෝ 1959 මාර්තු 25 වැනි දිනට යටත් පිරිසෙයින් අවුරුද්දකටවත් කලින් සිට සමුපකාර තරුණ සමාජයක සාමාජිකත්වය දැරීම. හෝ.

(2) ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක කළමනාකරුවෙකු, ලේකම් කෙනෙකු, ගණන් තබන්නෙකු හෝ ගණන් තැබීමේ ලිපිකරුවෙකු වශයෙන් 1959 මාර්තු 25 වැනි දින වන විට තුන් අවුරුද්දක් හෝ එයට වැඩි කාලයක් තිස්සේ නොකඩවා සේවයකර තිබී. හෝ,

(3) 1950 සිට 1957 දක්වා කාලය තුළ සමුපකාර විද්‍යාලයය මගින් පැවැත්වුණු සමුපකාර සේවකයින්ගේ සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටීම.

**අභ්‍යාස පංක්ති පැවැත්වෙන මධ්‍යස්ථාන**

(අ) පොල්ගොල්ලේ සමුපකාර අභ්‍යාස විද්‍යාලයය. සිංහල භාෂාවෙන් පංක්ති පැවැත්වේ. මෙහි පංක්තියකට බැඳීමට දිවයිනේ ඕනෑම කෙනෙකුට අයදුම් කිරීමට පුළුවන.

(ආ) මීගමුව, ගාල්ල, කුරුණෑගල, රත්නපුර, බණ්ඩාරවෙල, අනුරාධපුර සහ මඩකලපුව යන ප්‍රදේශයන්හි පිහිටුවා ඇති සමුපකාර අධ්‍යාපන මධ්‍යස්ථාන.

එක මධ්‍යස්ථානයකට ඇතුල් කර ගන්නා වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාව 30කි. මේ මධ්‍යස්ථානවලට ඇතුල් වීම අපේක්ෂාකරන අයදුම්කරුවන් එම පළාතේ පදිංචි හෝ සේවයේ යෙදී සිටින් අයවිය යුතු ය.

නේවාසික පහසුකම් සපයනු නො ලැබේ. මඩකලපුව හැර අනෙක් සියලුම මධ්‍යස්ථානයන්හි පංක්ති පැවැත්වෙන්නේ සිංහල භාෂාවෙන් පමණකි. මඩකලපුවේ පංක්ති පැවැත්වෙන්නේ දෙමළ භාෂාවෙනි.

(මෙපමණක් නොව යාපනේ සමුපකාර මහා සංගමය විසින් යාපනේ සමුපකාර අභ්‍යාස පාඨශාලාවේදී ද, සමස්ත ලංකා සමුපකාර මහා සංගමය විසින් කොළඹ, හලාවත, මාතර, කෑගල්ල හා කළුතර යන ස්ථානවලදී ද මේ බඳු පංක්ති පවත්වනු ලැබේ. එම පංක්තිවලට ඇතුල්වීම අපේක්ෂාකරන අයදුම්කරුවන් විසින් ඒ ඒ ආයතනයන් වෙත අයදුම් කළ යුත්තේ එසේ අයදුම්පත් කැඳවන බැව් පුවත්පත් නිවේදනයකින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රසිද්ධ කිරීමෙන් පසුවය).

**පුහුණුව වන්නවුන් තෝරා ගැනීම**

පුහුණුවන්නවුන් තෝරා ගැනීම සඳහා එක් එක් මධ්‍යස්ථානයේදී ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එම නිසා ඉල්ලුම් පත්‍ර එවීමේදී ප්‍රවේසම් විය යුතු ය. නියමිත සුදුසුකම් ඇති ආධුනිකයින් පමණක් ඉල්ලුම් පත්‍ර එවිය යුතු ය. පරීක්ෂණ ගාස්තුව වශයෙන් රුපියල් 2ක පෝස්ටල් ඕඩරයක් තමන්ගේ ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතු යි. සුදුසුකම් නො මැති අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු ආපසු ගෙවනු නො ලැබේ. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

**ගාස්තු**

ඉගැන්වීම සඳහා කිසිම මුදලක් අයකරනු නො ලැබේ. අභ්‍යාසය අවසානයේ පැවැත්වෙන විභාගයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් රුපියල් 2.50ක විභාග ගාස්තුවක් අයකරනු ලැබේ.

**කෑම් බීම් හා ඉඳුම් හිටුම්**

සමුපකාර අභ්‍යාස විද්‍යාලයයෙහි නේවාසික ශිෂ්‍ය සංඛ්‍යාවට ඇතුළත් වන අයෙකු විසින් ආහාර පානාදිය සඳහා මසකට ගෙවිය යුතු නේවාසික ගාස්තුව රුපියල් 40කි. අධ්‍යාපන මධ්‍යස්ථානයක හෝ වේවා සමුපකාර විද්‍යාලයෙහි හෝ වේවා නේවාසි නො වන ශිෂ්‍යයන් විසින් කෑම් බීම් හා ඉඳුම් හිටුම් සඳහා සුදුසු පිළිවෙලක් තමන් විසින් ම සොයා ගත යුතු ය.

**විභාගය හා සහතික පත්‍රය**

අභ්‍යාස කාලය අවසානයේ දී පරීක්ෂණයක් පවත්වා ඉන් සමත් වූ අයදුම්කරුවන්ට " සමුපකාර සේවකයින්ගේ සහතික පත්‍රය " ප්‍රදානය කරනු ලැබේ.

**රැකීරක්ෂා ලැබීමේ අපේක්ෂාව**

මෙම සහතිකය ලැබූ අයට රැකී රක්ෂා සපයාදීමට සමුපකාර දෙපාර්තමේන්තුව බැඳී නැත. එහෙත් විවිධසේවා සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා අනුව ඒ සමිතිවල කළමනාකරුවන් හා ලේකම්වරුන් පත් කිරිමේ දි සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා ගේ අනුමතිය අවශ්‍ය යි. " සමුපකාර සේවකයින්ගේ සහතික පත්‍රය " ලබා තිබන අය අතුරෙන් ඒ ඇබෑර්තු පුරවා ගත යුතු යැයි කොමසාරිස්තුමා සාමාන්‍යයෙන් නියම කරනු ඇත.

ආර්. ජේ. ජී. ද මැල්,
වැඩබලන සමුපකාර සංවර්ධන කොමසාරිස් හා
සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

1959 ජනවාරි 16 වැනි දින අංක 11,640 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ජීවාන්තක පෝර (ඇමෝනියම් සල්ෆේට්) සැපයීම සඳහා වූ අංක 210 දරන ටැන්ඩරය අවලංගු කරන ලද බව කරුණාවෙන් සලකන්න.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 පෙබරවාරි 24 වෙනි දින,
කොළඹ.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් 1959 මැයි 12 වැනි දින පෙරවරු 10 දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

| ද්‍රව්‍ය | ටැන්ඩර් අංකය |
|---|---|
| (1) ට්‍රක් රථ .... | ICA—215 |
| (2) ගල් පොඩි කිරීමේ හා වර්ග කිරීමේ යන්ත්‍රාගාර .... | ICA/DLF—15 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටැන්ඩර්

පෝර්ම ලබා ගැනීමට පෙර ටැන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරට වල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන් ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 පෙබරවාරි 27 වැනි දින,
කොළඹ.

---

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගතා සංවිධානය (ICA)

ගමනාගමනය හා රජයේ වැඩ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන් විසින් 1959 මැයි 13 වැනි දින පෙරවරු 9.30 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ඩම් ට්‍රක් රථ (ටැන්ඩර් අංක ICA—216) සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටැන්ඩර් පෝර්ම ලබා ගැනීමට පෙර ටැන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන් ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 පෙබරවාරි 24 වෙනි දින,
කොළඹ.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වව්නියාවේ ගොවිපළට හා කෘෂිකර්ම කායශාලයට පිළිස්සූ ගඩොල් සැපයීම

වව්නියාවේ කෘෂිකර්ම කායශාලයේ පරිපාලන නිලධාරි තැන විසින් පහත සඳහන් දේවල් සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 මාර්තු මස 26 දින පස්වරු 2.30 වන තෙක් බාරගනු ලැබේ :—

| | |
|---|---|
| වව්නියාවේ කෘෂිකර්ම කායශාලයට පිළිස්සූ ගඩොල් | 30,000 |
| වව්නියාවේ ගොවිපොළට පිළිස්සූ ගඩොල් | 50,000 |

2. වව්නියාවේ කෘෂිකර්ම කායශාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කායශාලය, වව්නියාව" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "වව්නියාවේ ගොවිපොළට හා කෘෂිකර්ම කායශාලයට ගඩොල් සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි. එක එක කායශයට වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර බාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන් ගේ නියෝජිතයන් හෝ විසින් වව්නියාවේ කෘෂිකර්ම කායශාලයේ පරිපාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "වව්නියාවේ ගොවිපොළට හා කෘෂිකර්ම කායශාලයට ගඩොල් සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු වව්නියාවේ කෘෂිකර්ම කායශාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර භාරගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ යට කී වේලාවේදී වව්නියාවේ කෘෂිකර්ම කායශාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසිපරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටස් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

13. කොන්ත්‍රාත් කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත් කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන් කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර වව්නියාවේ කෘෂිකර්ම කායශාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 පෙබරවාරි 11 වැනිදා,
පේරාදෙණියේදීය.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**දුම්රිය මාර්ගයේ වේල්ල සහ කොලොන්නාවේ වේල්ල (ප්‍රධාන මාර්ගයේ නොම්මර 4 කපොල්ල) වැඩිදියුණු කිරීම**

රුපියල් 36,000 හෝ ඊට වැඩි, වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් දුම්රිය මාර්ගයේ වේල්ල සහ කොලොන්නාවේ වේල්ල (ප්‍රධාන මාර්ගයේ නොම්මර 4 කපොල්ල) වැඩි දියුණු කිරීම සඳහා 1959 මාර්තු මස 25 වෙනි බදාදා උදය 11.30 වන තෙක් පහත සඳහන් ලිපිනයට ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. බුස්නාහිර පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා, කෝට්ට පාර, කොළඹ 8.

ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිට පතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9 යේ වේලුවන පාරේ කොළඹ උප ප්‍රාදේශීය කාර්යාලයේ ඉංජිනේරු මහතාගෙන් ලබාගත හැක. එම කාර්යාලයෙන්ම වැඩි විස්තර ලබා ගැනීමටත් සැලැස්ම බලා ගැනීමටත් හැක.

